කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම. කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

**දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු** **13 ශ්‍රේණිය**

| ආර්ථික විද්‍යාව I | 21 | S | I | පැය දෙකයි |
|---|---|---|---|---|

නම :- ...............................................................................

| I පත්‍රය සඳහා | |
|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව | ලකුණු |
| | |

♦ අංක 1 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

01. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අභිමතානුරූපී ප්‍රකාශය තෝරන්න.
   1. හිඟකම පිළිබඳ ප්‍රශ්නය සෑම ආර්ථිකයකම දක්නට ලැබේ.
   2. භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය, එහි මිල වෙනස් වීම සමඟ ධන සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි.
   3. වර්තමාන ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය අංක එකේ සංඛ්‍යාවකි.
   4. රාජ්‍ය සේවකයන්ට ගෙවන ජීවන වියදම් දීමනාව රු.5000 කින් වැඩි කළ යුතුය.
   5. මිනිස් වුවමනා සපුරා ලීම සඳහා ආර්ථිකයක් සතුව ඇත්තේ සීමිත සම්පත් ප්‍රමාණයකි.

(..........)

02. පහත දැක්වෙන ද්‍ර අතුරෙන් ප්‍රාග්ධනයට ඇතුළත් නොවන්නේ
   1. හම්බන්තොට වරාය 2. තේ වගාවක් 3. කුඹුරක්
   4. බැංකු ණයක් 5. සත්ත්ව ගොවිපළක්

(..........)

03. කුටුම්භ හා නිෂ්පාදන ආයතන වෙන් වෙන් වශයෙන් ගනු ලබන තීරණ අධ්‍යයනය කිරීම කෙරෙන ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය වනුයේ
   1. යථානුරූපී ආර්ථික විද්‍යාවයි. 2. සාර්ව ආර්ථික විද්‍යාවයි.
   3. සූක්ෂම ආර්ථික විද්‍යාවයි. 4. ගෘහ ආර්ථික විද්‍යාවයි.
   5. අභිමතානුරූපී ආර්ථික විද්‍යාවයි.

(..........)

04. පහත දැක්වෙන ද්‍ර අතුරින් නීච භාණ්ඩයක් (bads) ලෙස සැලකිය හැක්කේ කවරක්ද?
   1. දුම්වැටි 2. හරක් මස් 3. අවි ආයුධ 4. අපිරිසිදු වාතය 5. මත්ද්‍රව්‍ය

(..........)


05. මිල යන්ත්‍රණය පදනම් කර ගත් වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක දක්නට නොලැබෙන කරුණ වනුයේ
   1. මධ්‍යගත සැලසුම්කරණය
   2. තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකේන්ද්‍රණය වීමයි.
   3. පෞද්ගලික දේපළ ක්‍රමයයි.
   4. නිදහස් ව්‍යවසායයී
   5. ඉල්ලුම හා සැපයුම මත පදනම් වූ මිල ක්‍රමයයි.

(..........)

06. වෙළෙඳ පොළ ආර්ථිකයක් තුළ මිල ගණන් වල ප්‍රධාන කාර්යයක් වනුයේ,
   1. යහපත් ආදායම් ව්‍යාප්තියක් ඇති කිරීමයි.
   2. හිඟ සම්පත් සලාකනය කිරීමයි.
   3. හිඟ සම්පත් කළමණාකරණය කිරීමයි
   4. ආර්ථික ස්ථායීතාවය ඇති කිරීමයි.
   5. නිෂ්පාදන ආයතන වලට ලාභ ඉපයීම සඳහා යාන්ත්‍රණයක් ලබා දීමයි.

(..........)

07. එක්තරා ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම පහත රූප සටහනෙහි දැක්වේ.





නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත A ලක්ෂ්‍යයේ B සිට ලක්ෂ්‍ය කරා ගමන් කරන විට ඉන් අදහස් කෙරෙනුයේ,

1. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය පහළ වැටෙන බවයි.
2. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ඉහළ නගින බවයි.
3. පරිමාණානුකූල පිරිමැසුම් නිසා ආර්ථිකයට ප්‍රතිලාභ සැලසෙන බවයි.
4. ආර්ථිකයේ සම්පත් වැඩි වැඩියෙන් උපයෝජණයට යොදා ගන්නා බවයි.
5. ආර්ථිකයේ නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ යන බවයි.

(..........)

08. සිවිල් භාණ්ඩ හා මිලිටරි භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන එක්තරා ආර්ථිකයකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පහත රූප සටහනෙහි දක් වේ.




දැනට K ලක්ෂ්‍යයෙහි නිෂ්පාදනයේ යෙදී සිටින ආර්ථිකය, ප්‍රතිගමනයකට හෙවත් පසුබෑමකට මුහුණ දෙනු ලැබුව හොත් නිෂ්පාදන ලක්ෂ්‍යය,

1. K සිට N දක්වා වෙනස් වේ.
2. K සිට U දක්වා වෙනස් වේ.
3. K සිට L දක්වා වෙනස් වේ.
4. K සිට M , ලක්ෂය දක්වා වෙනස් වේ.
5. K සිට T ලක්ෂය දක්වා වෙනස් වේ.

(..........)

09. x සහ y භාණ්ඩ දෙක සඳහා වූ නිෂ්පාදන හැකියා මායිමක් පිටතට විතැන් කළ හැකි සිදුවීම හඳුනා ගන්න.


1. කළමනාකරණයේ වෙනසකින් පසු නිෂ්පාදනයේ අකාර්යක්ෂමතා අඩුවීම.
2. කර්මාන්ත දෙකෙහිම තාක්ෂණය යල් පැනීම.
3. කර්මාන්ත දෙකටම ගලා එන විදේශ සෘජු ආයෝජන වැඩිවීම.
4. විදේශ රටවල් මෙරටින් ඉල්ලුම් කරන භාණ්ඩ දෙවර්ගයම වැඩි කිරීම.
5. x කර්මාන්තයෙහි පුහුණු ශ්‍රමිකයින් පිටරටවල් වලට සංක්‍රමණය වීම.

10. ඉල්ලුම් වක්‍රයක් ඇඳීමේදී ස්ථාවරව නොපවතී යැයි සැලකෙනුයේ පහත දැක්වෙන කරුණු අතරින්,

1. එම භාණ්ඩයේ මිල
2. සියලුම භාණ්ඩ වල මිල
3. පාරිභෝගිකයාගේ අභිරුචිය
4. පාරිභෝගිකයාගේ ආදායම
5. ආදේශක භාණ්ඩ වල මිල

(..........)

11.





රූප සටහනෙහි දැක්වනුයේ සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රයක් නම් පහත සඳහන් කවර සංයෝජනයක් නිවැරදි වේද?

| සංයෝජනය | ආදායම් ඉල්ලුම් නම්‍යතාව | මිල ඉල්ලුම් නම්‍යතාව |
|---|---|---|
| 1 | ධන | ධන |
| 2 | සෘණ | සෘණ |
| 3 | ධන | සෘණ |
| 4 | සෘණ | ධන |
| 5 | ශූන්‍ය | ධන |

(..........)


12. එක්තරා භාණ්ඩයකට අදාළ සැපයුම් වක්‍රයක් පහත දැක්වේ. මෙම සැපයුම් වක්‍රය මගින් නිරූපණය කෙරෙන සැපයුම් සමීකරණය වනුයේ,




1. $Qs = 25 + 10p$
2. $Qs = -25 + 10p$
3. $Qs = 250 + 10p$
4. $Qs = 25 + \frac{p}{10}$
5. $Qs = 250 + 0.1p$

(..........)

13.




ඉහත සටහනෙහි දැක්වෙන සැපයුම් වක්‍රයෙහි මිල නම්‍යතාව නිවැරදිව විස්තර කෙරෙනුයේ කවර ප්‍රකාශයක් මගින්ද?

1. සියලුම නිමැවුම් මට්ටම් වලදී නම්‍යතාව එකට සමාන වේ.
2. සියලුම නිමැවුම් මට්ම් වලදී නම්‍යතාව 1ට වඩා වැඩි වන අතර එය නොවෙනස්වව පවතී.
3. සියලුම නිමවුම් මට්මම් වලදී නම්‍යතාව 1ට වඩා අඩු වන අතර එය නොවෙනස්ව පවතී.
4. නම්‍යතාව 1ට වඩා වැඩිවන අතර නිමැවුම වැඩි වන විට නම්‍යතාව අඩු වේ.
5. නම්‍යතාව 1ට වඩා අඩු වන අතර නිමැවුම වැඩි වන විට නම්‍යතාව වැඩි වේ.


(..........)

14. ක්‍රිකට් තරඟාවලියක් නැරඹීමේ ටිකට් පත් සඳහා වූ ඉල්ලුම් තත්ත්වය $Qd = 9000 - 10p$ යැයි පුරෝකතනය කරන ලදී. ක්‍රීඩාංගනයේ පැවති මුළු ආසන සංඛ්‍යාව 5000කි. මේ අනුව ටිකට් පතක සමතුලිත මිල වනුයේ

1. රු.100 2. රු.400 3. රු. 500 4. රු. 900 5. රු. 1400

(..........)

15. එක්තරා භාණ්ඩයක් අලෙවිකරන නිෂ්පාදකයෙකු මත ඒකක බද්දක් පැනවීමෙන් පසු ඇති වූ ප්‍රතිවිපාක පහත රූප සටහනේ දැක්වේ. බද්ද පැනවීමෙන් රජයට ලැබෙන අයභාරය දැක්වෙන්නේ




1. A B C E මගිනි
2. I H G F මගිනි
3. C E F G මගිනි
4. B C G H මගිනි
5. I G F E මගිනි

(..........)

16. උපරිම මිල ප්‍රතිපත්තියක් නිසා ඇති නොවන ප්‍රතිවිපාකයකි.

1. භාණ්ඩ අතිරික්තයක් ඇති වීම.
2. විධිමත් හෝ අවිධිමත් සලාක ක්‍රම ඇතිවීම.
3. කළුකඩ මිලක් බිහි වීම.
4. භාණ්ඩයේ ගුණාත්මක තත්ත්වය පහත හෙළීම.
5. වෙළෙඳුන් භාණ්ඩ තොග සඟවා තබා ගැනීම.

(..........)

17. කිසියම් රටක කැරට් වගාවේ නිරත ගොවීන්ගේ , කැරට් වෙළෙඳපොළේ ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් පහත සමීකරණයෙන් දැක්වේ.

$$Qd = 350 - 10p, Qs = -40 + 5p$$

ගොවීන්ට සහනයක් සැලසීමේ අරමුණින් රජය කැරට් කිලෝග්රෑමයකට රු.30ක සහතික මිලක් නියම කළේ නම්, එම මිල යටතේ ගොවීන් වෙළෙඳපොළට සපයන මුළු සැපයුම කොපමණද?

1. කිලෝග්රෑම් 90 2. කිලෝග්රෑම් 110 3. කිලෝග්රෑම් 150
4. කිලෝග්රෑම් 100 1. කිලෝග්රෑම් 105

(..........)

18. උණ පූර්ණ ගෙවීම් ක්‍රමයක ආර්ථික ප්‍රතිවිපාකයක් නොවන්නේ,

1. නිෂ්පාදක අතිරික්තය ඉහළ යාම.
2. පාරිභෝගික අතිරික්තය පහළ යාම.
3. පාරිභෝගිකයා ගෙවන මිල පහළ යාම.
4. නිෂ්පාදකයාට ලැබෙන මිල ඉහළ යාම.
5. රජයට වියදමක් දැරීමට සිදු වීම.

(..........)

19. පහත දැක්වෙන්නේ පූර්ණ තරඟකාරී වෙළෙඳපලක එක් ආයතනයක තොරතුරු සමූහයකි.

| මිල | ඉ/ප්‍ර | මුළු පිරිවැය |
|---|---|---|
| p | Q | TC |
| 3 | 5 | 12 |
| 3 | 6 | 13 |
| 3 | 7 | 15 |
| 3 | 8 | 18 |
| 3 | 9 | 22 |

ඉහත ලේඛනයට අනුව ආන්තික ආදායම (MR) ආන්තික පිරිවැය (MC) සමාන වන මිල සහ ප්‍රමාණය වන්නේ,

1. මිල රුපියල් 3යි ඒකක 7 යි.
2. මිල රුපියල් 3 යි ඒකක 8 යි.
3. මිල රුපියල් 3 යි ඒකක 7.5 යි.
4. මිල රුපියල් 3යි ඒකක 8.5 යි
5. මිල රුපියල් 3 යි ඒකක 6.5 යි.

(..........)

20. විශාල විකුණුම්කරුවන් සංඛ්‍යාවක් එකම වර්ගයේ නමුත් එකිනෙකට විශේෂිකරණය කරනලද භාණ්ඩයක් විකුණන වෙළෙඳපල තත්ත්වය හඳුන්වන්නේ

1. පූර්ණ තරඟකාරී වෙළෙඳපල ලෙස ය.
2. ඒකාධිකාරී වෙළෙඳපල ලෙස ය.
3. ඒකාධිකාරී තරඟ වෙළෙඳපල ලෙස ය.
4. කතිපයාධිකාරී වෙළෙඳපල ලෙස ය.
5. ද්වි අධිකාරී වෙළෙඳපල ලෙස ය.

(..........)

21. කෙටි කාලයේ දී නිෂ්පාදන ආයතනයක සාමාන්‍ය පිරිවැය වක්‍රය සහ ආන්තික පිරිවැය වක්‍රය ඉංග්‍රීසි U අකුරක හැඩය ගන්නේ කුමන හේතුව නිසාද?

1. පරිමාණුකූල ඵල නීතිය ක්‍රියාත්මක වීම නිසාය.
2. හීනවන ආන්තික ඵලදා නීතිය ක්‍රියාත්මක වීම නිසාය.
3. මුළු ඵලදාව වැඩිවන විට ආන්තික ඵලදාව අඩුවන නිසාය.
4. මුළු අයභාරය වැඩිවන විට ආන්තික අයභාරය අඩු වන නිසාය.
5. සාමාන්‍ය ස්ථාවර පිරිවැය වක්‍රයේ බෑවුම සෘණ අගයක් ගැනීම නිසාය.


(..........)

22. ආර්ථික ලාභ ශුන්‍ය වීම ව්‍යාපාර ආයතනයකට අවාසිදායක තත්ත්වයක් නොවේ . මේ යටතේ ආයතනය

1. ආවස්ථික පිරිවැය ආවරණය කර ගනී.
2. රජය නිෂ්පාදන පිහිටාධාර ලබා දීම නිසා වියදම් ආවරණය කරගනී.
3. මිලෙන් සමාන්‍ය විචල්‍ය පිරිවැය. (AVC) ආවරණය කර ගනී
4. මිලෙන් සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ආවරණය කර ගනී.
5. මිලෙන් සාමාන්‍ය ස්ථාවර පිරිවැය ආවරණය කර ගනී.

(..........)

23. පහත දැක්වෙන්නේ පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ ආයතනයක වෙළෙඳපොල තත්වයයි. මෙහි දැක්වෙන්නේ,




1. ආර්ථික පාඩු ලැබූ අවස්ථාවකි.
2. නිෂ්ප්‍රමාණික ලාභ ලබන අවස්ථාවකි.
3. ප්‍රමාණික ලාභ ලබන අවස්ථාවකි.
4. වෙළෙඳපොලෙන් පිටවිය යුතු තත්ත්වයකි.
5. අලාභ ලැබුවත් තවදුරටත් වෙළෙඳපොලේ රැඳී සිටිය යුතු තත්ත්වයකි.

(..........)

24. සංවෘත ආර්ථිකයක සමතුලිත ආදායම වියදම් කරන ආකාරය දැක්වෙන සමීකරණය තෝරා ගන්න.

1. y = C+S+T
2. y = C+I+G
3. y = C+S+X
4. y = C+S+I
5. y= C+I+M

(..........)

25. සංවෘත ආර්ථිකයක වැය කළ හැකි කුටුම්භ ආදායම ගණනය කරන සූත්‍රය දක්වන්න.

1. Yd = Y - T
2. Yd = Y - T + R
3. Yd = Y + R
4. Yd = Y - R
5. Yd = Y + T - R

(..........)

26. ජාතික ගිණුම්කරණයේදී මූලික මිල යටතේ දළ එකතු කළ අගය (GVA) ලෙස සැලකෙන්නේ,

1. ආර්ථික ප්‍රදේශය තුළ නේවාසික ආයතනික ඒකක විසින් නිපදවන ලද සියලු භාණ්ඩ හා සේවාවන්ගේ මුදල්මය වටිනාකමයි.
2. ආර්ථික ප්‍රදේශය තුළ නේවාසික ආයතනික ඒකක විසින් නිපදවන ලද සියලු භාණ්ඩ හා සේවාවන්ගේ මුදල්මය වටිනාකම + නිෂ්පාදිතය මත ශුද්ධ බදු වේ.
3. මූලික මිල යටතේ නිෂ්පාදිතයේ වටිනාකම + නිෂ්පාදිතය මත අනෙකුත් ශුද්ධ බදු වේ.
4. ප්‍රාථමික ආදායම් වල එකතුව - ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය වේ.
5. මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම - ගැනුම්කරුගේ මිල යටතේ අතරමැදි පරිභෝජනය වේ.

(..........)

27. දෙන ලද වර්ෂයක කිසියම් රටක ප්‍රාග්ධන සම්පාදනයට ඇතුළත් වන ඇතැම් අයිතම පහත වගුවේ පෙන්නුම් කෙරේ.

| අයිතමය | වටිනාකම (රු) |
|---|---|
| පදිංචි නිවාස, ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම්වෙන්දේසි කිරීම. | 5000 |
| යන්ත්‍ර සහ උපකරණ | 1000 |
| කිරි ගවයින් | 100 |
| පරිගණක මෘදුකාංග සහ දත්ත පද්ධති | 200 |
| ඉඩම් සංවර්ධනය | 400 |
| ස්වාධිකාරක සහ බලපත්‍ර අත්කර ගැනීම | 300 |
| පරිලේඛණ චක්‍ර වෙනස් වීම් | 150 |
| වටිනාකම අත්කර ගැනීම් - අත්හැරීම් | 50 |
| නිමි භාණ්ඩ හා අමුද්‍රව්‍ය | 50 |

මෙම රටේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සහ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පිළිවෙළින් රුපියල් මිලියන

1. 7200 සහ 7500ක් වේ.
2. 7200 සහ 7000 ක් වේ.
3. 6700 සහ 6650 ක් වේ.
4. 7250 සහ 7200 ක් වේ.
5. 7000 සහ 7200 ක් වේ.

(..........)

28. කිසියම් කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම් සඳහා අදාළ දත්ත සමහරක් පහත වගුවේ දැක්වේ.

| අයිතම | වටිනාකම රු. බි |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | 10,000 |
| පෞද්ගලික පරිභෝජනය | 6400 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1600 |
| ශුද්ධ අපනයන | -500 |

මෙම ආර්ථිකයේ පරිභෝජනය සහ දේශීය ඉතුරුම් වල අගයන් කොපමණද?

| | රජය පරිභෝජනය (රු. ශ.) | දේශීය ඉතුරුම් (රු. ශ.) |
|---|---|---|
| 1. | 2000 | 1000 |
| 2. | 2500 | 1100 |
| 3. | 2500 | 2100 |
| 4. | 2600 | 1200 |
| 5. | 3000 | 1100 |

29. පසුගිය වර්ෂයේදී කිසියම් රටක පොදු මිල මට්ටම ඉහල ගිය නමුදු භාණ්ඩ හා සේවා නිෂ්පාදිතය නොවෙනස්ව තිබුණි යැයි සලකන්න. මෙම තොරතුරු වලට අනුව පහත සඳහන් කවරක් නිවැරදි වේද?

| | නාමික දළ දේශීය නිෂ්පාදිතය | මූලික දළ දේශිය නිෂ්පාදිතය |
|---|---|---|
| 1. | ඉහළ ගියේය. | ඉහළ ගියේය |
| 2. | නොවෙනස්ව තිබුණි | නොවෙනස්ව තිබුණි |
| 3. | පහළ වැටුණි | පහළ වැටුණි |
| 4. | ඉහළ ගියේය. | නොවෙනස්ව තිබුණි |
| 5. | පහළ වැටුණි | ඉහළ ගියේය. |

30. ජාතික ගිණුම් යනුවෙන් අදහස් කෙරෙන්නේ

1. සියලු නිෂ්පාදන ඒකක වල වසර අවසානයේ ගිණුම් වල එකතුවයි.
2. නිමවුම්, ආදායම් ,වියදම් යන ප්‍රවේශ යොදා ගෙන රටක සමස්ත නිෂ්පාදනයේ අගය ගණනය කර ඉදිරිපත් කිරීමයි.
3. රටක ජාතික නිෂ්පාදිතය එකතු කළ අගය මගින්ද අවසාන නිෂ්පාදිතය මගින් ද ඉදිරිපත් කිරීමය.
4. දේශිය නිෂ්පාදිතයට ශුද්ධ විදේශ සංචිත ආදායම එකතු කිරීමෙන් ජාතික නිෂ්පාදිතයේ අගය ලබා ගැනීමයි .
5. වසර අවසානයේ රජය මුළු ආදායම හා වියදම්, ඉතුරුම්ය.

(..........)

31. කිසියම් ආර්ථිකයක සලකා බලන වර්ෂයෙහි මූලික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 8000 ක්ද එම වර්ෂයේ නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 6000ක් ද වූයේ නම් දළ දේශීය නිෂ්පදිතයේ අවධමනකය

1. 0.75 කි. 2. 1.33 කි. 3. 1.66 කි. 4. 1.75 කි. 5. 2.00 කි

(..........)

32. මුදල් භාවිතය නිසා වර්තමානයේ ඕනෑම භාණ්ඩයක හෝ සේවාවක හුවමාරු වටිනාකම මුදලින් තක්සේරු කිරීමට ඇති හැකියාව

1. වටිනාකමේ සන්නිධියක් ලෙසයි.
2. වටිනාකමේ ගිණුම් ඒකකයක් ලෙසයි.
3. විනිමය මාධ්‍යක් ලෙසයි.
4. විලම්භීත ගෙවුම් මාධ්‍යක් ලෙසයි.
5. හුවමාරු මාධ්‍යක් ලෙසයි.

(..........)

33. වාණිජ බැංකුවක පහත සඳහන් වත්කම් අතරින් අඩුම ද්‍රවශීලතාවය ඇති වත්කම කුමක්ද?

1. භාණ්ඩාගාර බිල්පත්
2. මහ බැංකුවේ ඇති ශේෂ
3. කැට මුදල්
4. ගනුදෙනු කරුවන්ට දෙන ලද අත්තිකාරම්
5. ඒක්ෂණ මුදල්

(..........)

34. කල්පිත ආර්ථිකයක කටයුතු කරන වාණිජ බැංකුවක පහත දැක්වෙන තොරතුරු සපයා ඇත.

| | රු. මිලියන |
|---|---|
| මුදල් සංචිත | 1300 |
| ඉල්ලුම් තැන්පතු | 10000 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාත | 10% |

මෙම බැංකුව සතු අධි සංචිත ප්‍රමාණය වන්නේ,

1. 100 කි. 2. 200 කි. 3. 300 කි. 4. 700 කි. 5. 1000 කි.

(..........)

35. ශ්‍රී ලංකා මහ බැංකුව වාණිජ බැංකු සමග ප්‍රති විකුණුම් ගිවිසුම් ඇතිකර ගත්විට

1. වාණිජ බැංකු සංචිත පහත වැටේ.
2. මුදල් වෙළෙඳ පොළේ පොලී අනුපාතික ඉහළ යයි
3. මුදල් සැපයුම පහළ වැටේ.
4. ඒක්ෂණ ණය වෙළෙඳ පොලෙහි පොලී අනුපාතය පිළිබඳ ඉහළ සීමාව තීරණය වේ.
5. ඒක්ෂණ ණය වෙළෙඳ පොලෙහි පොලී අනුපාතය පිළිබඳ පහළ සීමාව තීරණය වේ.

(..........)

36. ආර්ථික විද්‍යාඥයන් විසින් ''රජයේ අසමත්වීම්'' නමින් හඳුන්වනු ලබන සංසිද්ධියට වඩාත්ම බල පෑ හැකි හේතුව වන්නේ පහත ද අතුරින් කවරක්ද?

1. වෙළඳපලවල අපූර්ණ තරගය පැවතීම.
2. අවගුණ භාණ්ඩ අධි පරිභෝජණය
3. ඇතැම් භාණ්ඩ සඳහා සෘණ බාහිරතා තිබීම.
4. ආදායම් හා ධන ව්‍යාප්තියේ අසමානතා පැවතීම.
5. දේශපාලඥයින් ස්වාර්ථය උදෙසා කටයුතු කිරීම.

(..........)

37. ශුද්ධ පොදු භාණ්ඩයක් යනු,

1. පරිභෝජනයේ තරගකාරිත්වයක් පවතින සහ පරිභෝජනය වැලැක්විය නොහැකි භාණ්ඩයකි.
2. වෙළඳපල විසින් කාර්යක්ෂමව සපයනු ලබන පරිභෝජණය වැලැක්විය හැකි භාණ්ඩයකි.
3. පරිභෝජණයේ තරගකාරීත්වයක් නොමැති සහ පරිභෝජණය වැලැක්විය හැකි භාණ්ඩයකි.
4. පරිභෝජණයේ තරගකාරිත්වයක් නොමැති සහ පරිභෝජණය වැලැක්විය නොහැකි භාණ්ඩයකි.
5. පරිභෝජණයේ තරගකාරීත්වයක් පවතින සහ පරිභෝජණය වැලැක්විය හැකි භාණ්ඩයකි.

(..........)

38. මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යයන කිරීමේදී පුළුල් වශයෙන් භාවිතා කළ ණය උපකරණය වූයේ,

1. භාණ්ඩාගාර බිල්පත්
2. රුපියල් සුරැකුම්පත්
3. භාණ්ඩාගාර බැදුම්කර
4. මහ බැංකු අත්තිකාරම්
5. ශ්‍රී ලංකා සංවර්ධන බැදුම්කර

(..........)

39. සමාහාර ඉල්ලුම විශාල ප්‍රමාණයකින් වැඩි කිරීම සඳහා අයවැය හිඟය මූල්‍යනයට වඩාත්ම සුදුසු ක්‍රමය වන්නේ

1. මහ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම.
2. විදේශිකයන්ට පිළිණපත් අලෙවි කිරීම.
3. ජාතික ඉතිරිකිරීමේ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම.
4. වාණිජ බැංකුවට පිළිණපත් අලෙවි කිරීම
5. සේවක අර්ථසාධක අරමුදලට පිළිණපත් අලෙවි කිරීම.

(..........)

40. ප්‍රතික්‍රමික ආදායම් බද්දක් ක්‍රියාත්මක වන විට දිළින්දන්,
    1. තම ආදායමින් ධනවත් අයට වඩා අඩු ප්‍රතිශතයක් බදු ලෙස ගෙවති.
    2. ධනවත් අයට වඩා වැඩි රුපියල් ප්‍රමාණයක් බදු ලෙස ගෙවති.
    3. තම ආදයමින් ධනවත් අයට වඩා වැඩි ප්‍රතිශතයක් බදු ලෙස ගෙවති.
    4. ධනවත් අයට වඩා අඩු රුපියල් ප්‍රමාණයක් බදු ලෙස ගෙවති.
    5. තම ආදායමට සමාන අනුපාතිකයක් බදු වශයෙන් ගෙවති.

(..........)

41. ජපානයෙහි රෙදි ඒකකයක් නිපදවීම සඳහා ශ්‍රම පැය 25ක් ද සහල් ඒකකයක් නිපදීම සඳහා ශ්‍රම පැය 50ක් ද වැය වේ. තායිලන්තයට රෙදි ඒකකයක් නිපදවීම සඳහා ශ්‍රම පැය 100ක් ද සහල් ඒකකයක් නිපදවීම සඳහා ශ්‍රම පැය 100ක් ද වැයවේ. මේ අනුව පහත කවරක් නිවැරදි වේද?
    1. සහල් නිපදවීම තායිලන්තයට සාපේක්ෂව වාසී පවතී.
    2. රෙදි නිපදවීම ජපානයට සාපේක්ෂව වාසි පවතී.
    3. රෙදි නිපදවීමට තායිලන්තයට සාපේක්ෂව වාසි පවතී.
    4. රටවල් දෙකම රෙදි නිෂ්පාදනය කළ යුතුය.
    5. සහල් නිෂ්පාදනය සඳහා ජපානයට සාපේක්ෂව වාසී පවතී.

(..........)

42. පහත කරුණු අතරින් රටවල් අතර සාපේක්ෂ වාසි තීරණය කෙරෙන නිර්ණායකයක් ලෙස ඇතුළත් නොවන්නේ,
    1. භූගෝලීය පිහිටීම.
    2. දේශගුණය
    3. ශ්‍රම හමුදාවේ නිපුණතාවයන්ය.
    4. ශ්‍රමිකයකුගේ ප්‍රාග්ධනයේ ප්‍රමාණය
    5. ඒක පුද්ගල ආදායමය.

(..........)

43. රටක වෙළඳ ශේෂ අතිරික්තය ඉහල යාමට හේතුවක් වනුයේ,
    1. දේශීය උද්ධමනය ඉහල යාමය.
    2. හවුල්කාර රටවල් විසින් තීරුබදු පැනවීමයි.
    3. ව්‍යවහාර මුදල් ඒකකයේ වටිනාකම ඉහළ යාමයි.
    4. ආනයන පහළ යාම හා අපනයන ඉහළ යාමයි.
    5. රටට ගලා එන සෘජු විදේශ ආයෝජණ ඉහළ යාමයි.

(..........)

44. සාපේක්ෂ දරිද්‍රතාවය හා නිරපේක්ෂ දරිද්‍රතාවය මැන බැලීම සඳහා යොදා ගත හැකි දර්ශක දෙක පිළිවෙලින්.
    1. ජිනි සංගුණකය සහ විදුලි පරිභෝජණයයි.
    2. කුටුම්භ ආදායම හා ජිනී සංගුණකයයි.
    3. දරිද්‍රතා ඉම සහ ජිනි සංගුණකයයි.
    4. පිරිසිදු පානීය ජලය හා මාතෘ පෝෂණයයි.
    5. ජිනී සංගුණකය හා දරිද්‍රතා ඉමයි.

(..........)

45. අන් සාධක නොවෙනස්ව තිබිද්දී දේශීය මුදල් ඒකකයේ බාහිර අගය වැඩිවීමත්,
    1. ආනයන කරනු ලබන භාණ්ඩවල දේශීය මිල ඉහල නංවයි.
    2. ආනයන කරනු ලබන භාණ්ඩවල විදේශ මිල ඉහළ නංවයි.
    3. ආනයන කරනු ලබන භාණ්ඩවල දේශීය මිල ඉහළ නංවයි.
    4. ආනයන කරනු ලබන භාණ්ඩවල විදේශ මිල පහළ හෙළයි.
    5. විදේශීය රටක දී දේශීය මුදල් ඒකකයේ වටිනාකම පහල හෙලයි.

(..........)

46. මූර්ත විනිමය අනුපාතිකය පහළ යාමෙන් ඇතිවන ආර්ථික ප්‍රතිවිපාකයක් නොවන්නේ,
    1. අපනයන තරඟකාරිත්වය වැඩිවීම
    2. අපනයන ධෛර්යමත් වීම.
    3. ආනයන අධෛර්යමත් වීම.
    4. වෙළඳ ගිණුමේ යහපත් ප්‍රවණතාවයක් ඇති වීම.
    5. ආනයනකරුවන් දිරිමත් වීම.

(..........)

47. සංවර්ධන වෙමින් පවත්නා රටවල ආර්ථික වර්ධනය කෙරෙහි බාධකයක් නොවනුයේ පහත දැ අතුරින් කුමක්ද?
1. සීඝ්‍ර ජනගහන වර්ධනය
2. පහත් ඉතුරුම් අනුපාතය
3. වැඩිවන විදේශ ණය බර
4. ඉහළ යැපුම් අනුපාතිකය
5. බහු ජාතික සමාගම් තිබීම.

(..........)

48. ආර්ථික සංවර්ධනය යන්නෙන් අදහස් කරනුයේ
1. ආර්ථික වෘද්ධියයි.
2. ආර්ථික වෘද්ධියට අමතරව ආදායම් ව්‍යාප්තියේ හා ආර්ථික ව්‍යුහයේ හිතකර වෙනස්කම් හට ගැනීම.
3. නාගරික ජනතාවගේ සුභ සාධන මට්ටම උසස් වීම.
4. දළ ජාතික ආදායමේ මූර්ත අගය ඉහළ යාම.
5. සාපේක්ෂ දරිද්‍රතාවය තුරන් කිරීම.

(..........)

49. BRICS රටවල් වලට අයත් නිවැරදි කාණ්ඩය වන්නේ,
1. බ්‍රසීලය, රුසියාව, ඉතියෝපියාව, චීනය, දකුණු අප්‍රිකාව
2. බ්‍රසීලය, රුසියාව, ඇමරිකාව, කැනඩාව, චීනය
3. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව
4. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, කැනඩාව, ස්විස්ටර්ලන්තය
5. බ්‍රසීලය, රුසියාව, ඉන්දුනීසියාව, කොලොම්බියාව, දකුණු අප්‍රිකාව

(..........)

50. ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතිය අතර වැඩිම සහනාධාරලාභීන් සිටින්නේ,
1. පොහොර සහනාධාර
2. සමෘද්ධි සහනාධාර
3. පාසල් දිවා ආහාර
4. ආබාධිත සෙබල සහනාධාර
5. අවු. 70ට වැඩි වයස් යැපෙන්නන්ගේ සහනාධාර

(..........)